විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම 2025.03.04
පළාත් ඉංජිනේරු කාර්යාංශය (බ.ප.)

2025 වර්ෂයේ I කාර්තු වෙනි I වන විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම 2025.03.04 දින නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) කාර්යාලයේ දී පැවැත් වූ අතර එහි රැස්වීම් වාර්තාව පහත පරිදි ඉදිරිපත් කරමි.

2025.03.04 වන දින පෙ.ව.9.30 ට නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) කේ.ආර්.අබේසිරිවර්ධන මයාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වූ අතර එදින එතුමා විසින් පැමිණ සිටි සියළු නිලධාරීන් පිළිගෙන ප්‍රාදේශීය ඉංජිනේරුවරු මෙම රැස්වීම සඳහා Zoom තාක්‍ෂණය ඔස්සේ සම්බන්ධ කරගෙන රැස්වීමේ කටයුතු ආරම්භ කෙරුණි.

සහභාගී වූ නිලධාරීන්

01. කේ.ආර්.අබේසිරිවර්ධන මයා - නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) - පළාත් ඉංජිනේරු කාර්යාංශය (බ.ප.)
02. ටී.කේ.ආර්.දිලේශිකා මිය - ප්‍රධාන ගණකාධිකාරී - පළාත් ඉංජිනේරු කර්යාංශය (බ.ප.)
03. එම්.කේ.සුගත් ද සිල්වා මයා - විගණන අධිකාරී - ජාතික විගණන කාර්යාලය.
04. එස්.පී.පර්සි කුලවන්ස මයා - අභ්‍යන්තර විගණක - අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව (බ.ප.)
05. පී.එල්.ඩී.ඒ.එස්.පනාගොඩ මිය - අධ්‍යක්ෂ ඉංජිනේරු - පළාත් ඉංජිනේරු කාර්යාංශය (බ.ප.)
06. එල්.එම්.ඩී.ආර්.ද මෙල් මිය - ගණකාධිකාරී - පළාත් ඉංජිනේරු කාර්යාංශය (බ.ප.)
07. කේ.කේ.පී.රණතුංග මිය - පරිපාලන නිලධාරී - පළාත් ඉංජිනේරු කාර්යාංශය (බ.ප.)
08. ඩබ්.අයි.නිලාන්ති මෙය - මුදල් සහකාර - පළාත් ඉංජිනේරු කාර්යාංශය (බ.ප.)
09. එල්.එස්.පී.පෙරේරා මිය - කළමනාකරණ සේවා නිලධාරී පළාත් ඉංජිනේරු කාර්යාංශය(බ.ප.)
10. කේ.එල්.එම්.සඳරුවණි - කළමනාකරණ සේවා නිලධාරී - පළාත් ඉංජිනේරු කාර්යාංශය(බ.ප.)
11. ඩබ්.ඒ.කේ.එස්.වීරසිංහ මිය - සංවර්ධන නිලධාරී - පළාත් ඉංජිනේරු කාර්යාංශය(බ.ප.)

**ප්‍රාදේශීය ඉංජිනේරුවරු මෙම රැස්වීම සඳහා Zoom තාක්‍ෂණය ඔස්සේ සම්බන්ධ වන ලදී.**

12. ජී.ඩී.විපුලසේන මිය - ප්‍රාදේශීය ඉංජිනේරු - බත්තරමුල්ල.
13. ආර්.ඩබ්.සී.ගුණවර්ධන මිය - ප්‍රාදේශීය ඉංජිනේරු - කොළඹ.
14. ඒ.කේ.රුවන් අලවත්ත මයා - ප්‍රාදේශීය ඉංජිනේරු - මීගමුව.
15. එෆ්.බී.සම්පත් මයා - ප්‍රාදේශීය ඉංජිනේරු - හොරණ.
16. එස්.ඩී.සේනාරත්න මිය - ප්‍රාදේශීය ඉංජිනේරු - පානදුර.
17. පී.ආර්.මධුරංග මයා - ප්‍රාදේශීය ඉංජිනේරු - මිනුවන්ගොඩ.
18. ඉනෝකා කොටඹගේ මිය - ප්‍රාදේශීය ඉංජිනේරු - බියගම.
19. එල්.ඩී.ගලබඩ මිය - ප්‍රාදේශීය ඉංජිනේරු - ගම්පහ.
20. ඒ.ඒ.ද සොයිසා මයා - ප්‍රාදේශීය ඉංජිනේරු - හෝමාගම.
21. ඩබ්.ජී.ආර්.වේලාතන්ත්‍රි මයා - ප්‍රාදේශීය ඉංජිනේරු - මතුගම.
22. පී.ආර්.මධුරංග මයා - ප්‍රාදේශීය ඉංජිනේරු - වත්තල.
23. ඩී.සී.එන්.කලන්සූරිය මයා - ප්‍රාදේශීය ඉංජිනේරු - කළුතර.
24. එස්.ඩී.සේනාරත්න මිය - ප්‍රාදේශීය ඉංජිනේරු - රත්මලාන.

## 01. පසුගිය විගණන කමිටු වාර්තාවේ ප්‍රගතිය සාකච්ඡා කිරීම

<table>
<tr><th></th><th>කාරණය</th><th>සාකච්ඡා වූ කරුණු/ තීරණ</th><th>වගකීම</th></tr>
<tr><td>01</td><td>මාසික බැංකු සැසඳුම්</td><td>බැංකු සැසඳුමේ මෘදු පිටපත පමණක් සෑම මසකම ඊලග මස 15 දිනට පෙර අභ්‍යන්තර විගණනය වෙත ඉදිරිපත් කරන ලෙස නැවතත් නි.ප්‍ර.ලේ. (ඉංජිනේරු) විසින් ප්‍රාදේශීය ඉංජිනේරුවරුන්ව දැනුවත් කරන ලදි.<br><br>බැංකු සැසඳුම් මෘදු පිටපත ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලය විසින් නියමිත දින වන විට අභ්‍යන්තර විගණන කාර්යාලයට යැවුව ද පානදුර ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලයේ 2024 නොවැම්බර් හා දෙසැම්බර් ද හෝමාගම ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලයේ 2024 දෙසැම්බර් මස බැංකු සැසඳුම් මෘදු පිටපත් අභ්‍යන්තර විගණන කාර්යාලයට ලැබී නොමැති බව අභ්‍යන්තර විගණක ප්‍රකාශ කරන ලදී.<br><br>පානදුර හා හෝමාගම ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාල විසින් අභ්‍යන්තර විගණන කාර්යාලය ඉදිරිපත් කර නොතිබු බැංකු සැසඳුම් මෘදු පිටපත් නොපමාව ඉදිරිපත් කරන ලෙස නි.ප්‍ර.ලේ. (ඉංජිනේරු) විසින් පානදුර හා හෝමාගම ප්‍රාදේශීය ඉංජිනේරු දැනුවත් කරන ලදි.</td><td>ප්‍රධාන ගණකාධිකාරි / ගණකාධිකාරි<br>සියළුම ප්‍රාදේශීය ඉංජිනේරුවරු</td></tr>
<tr><td>02</td><td>අත්තිකාරම් ‘බී’ ගිණුමට අදාලව ණය අය නොවීම.</td><td>2025.03.04 දිනට නොපියවා ඇති ණය අයවීම් පිළිබඳ වාර්තාව
<table>
<tr><th>අනු අංකය</th><th>නිලධාරිගේ නම</th><th>තනතුර</th><th>ස්ථාන මාරුවී ගිය දිනය</th><th>2025.02.28 දිනට අයවීමට ඇති ණය ශේෂය රු.</th></tr>
<tr><td></td><td colspan="4">පළාත් පාලන ආයතන වලට ස්ථාන මාරුවී ගිය නිලධාරින්ගෙන් අයවිය යුතු ණය ශේෂයන්</td></tr>
<tr><td rowspan="2">1</td><td rowspan="2">ඩබ්.ඒ.ටී.එස්. වනිගසුන්දර මිය</td><td>කළමනාකරණ සහකාර</td><td>2020.01.01</td><td>රු. 112,400.00</td></tr>
<tr><td colspan="3">මාසික වාරික වශයෙන් නිරවුල් වන දේපළ ණය ශේෂයක් වන අතර සම්පූර්ණ ණය ශේෂය පියවීමට මෙතෙක් කටයුතු කර නොමැත.</td></tr>
<tr><td rowspan="2">2</td><td rowspan="2">අයි.ජී.ටී.පෙරේරා මිය</td><td>කළමනාකරණ සහකාර</td><td>2020.02.17</td><td>රු. 3,000.00</td></tr>
<tr><td colspan="3">2024.12.28 දිනැති අංක 688436 දරණ චෙක්පතින් ශේෂය පියවා අවසන් කර ඇත.</td></tr>
<tr><td rowspan="2">3</td><td rowspan="2">පී.ජී.එල්.ආලෝකා මිය</td><td>තාක්ෂණ නිළධාරි</td><td>2020.02.10</td><td>රු. 94,404.00</td></tr>
<tr><td colspan="3">මාසික වාරික වශයෙන් නිරවුල් වන ආපදා ණය ශේෂයක් වන අතර සම්පූර්ණ ණය ශේෂය ශේෂය එකවර පියවීමට කටයුතු කරන ලෙස මො ටුව මහා නගර සභාව වෙත දැනුම් දී ඇත.</td></tr>
<tr><td rowspan="2">4</td><td rowspan="2">ආර්.පී.එස්.විදුරංග මයා.</td><td>කළමනාකරණ සේවා නිලධාරි</td><td>2023.07.17</td><td>රු. 214,961.00</td></tr>
<tr><td colspan="3">මෙතෙක් ණයශේෂ නිරවුල් කර නොමැති පළාත් පාලන ආයතන වෙත ලබා දිමට ඇති මුදුදර බඳු වලින් ණය ශේෂය පියවීමට පළාත් පාලන කොමසාරිස්ගේ LGD/01/H/2025/05 හා 2025.02.05 දිනැති ලිපියෙන් ණය ශේෂය තහවුරු කරන ලෙස දන්වා ඇති අතර මගේ අංක:CSWP/ENG-ACC/8-10/FI/1 හා 2025.02.17 දිනැති ලිපියෙන් ණය ශේෂය දන්වා යවා ඇත.</td></tr>
<tr><td></td><td colspan="3"></td><td>424,765.00</td></tr>
</table></td><td>ප්‍රධාන ගණකාධිකාරි / ගණකාධිකාරි</td></tr>
</table>

| | | | | |
|---|---|---|---|---|
| | රජයට /වෙනත් පළාත් සභාවකට /පළාත් සභාවේ වෙනත් කාර්යාලයකට ස්ථාන මාරුවී ගිය නිලධාරින්ගෙන් අයවිය යුතු ණය ශේෂ - විදේශ ධූක සේවය සඳහා | | | |
| 6 | එම්.එච්.ගුණසේකර මිය | කළමනාකාරණ සේවා නිලධාරි | 2020.02.07 | රු.78,600.00 |
| | | රු.7,800/- බැගින් කාර්තු වශයෙන් ණය වාරික නිරවුල් කරනු ලබයි. | | |
| | සේවය හැර ගොස් ඇති නිලධාරින්ගෙන් අයවිය යුතු ණය ශේෂ | | | |
| 7 | ආර්.ඒ.එම්.එම්. රණසිංහ මිය. | තාක්ෂණ නිලධාරි | 2013.01.15 | රු. 119,689.00 |
| | | මෙම නිලධාරිනියගේ ණය අය කර ගැනීම සම්බන්ධයෙන් පවතින නීති ක්‍රියාවලිය පිළිබඳ වත්මන් ප්‍රගතිය 2025.02.21 දිනට පෙර කැඳවා ඇතත් මෙහි වර්තමාන තත්තවය වාර්තා කර නොමැත. | | |

පළාත් පාලන ආයතන වෙත ස්ථාන මාරු වී ගිය නිලධාරින්ගෙන් අයවිය යුතු ණය ශේෂ එකවර පියවන ලෙස ආදාල පළාත් පාලන ආයතන ප්‍රධානින්ට හා අධ්‍යක්ෂ (ආදායම් හා මුදල්) වෙත පිටපතක් සහිතව CSWP/ENG-ACC/8-10/FI/1 හා 2024.12.24 දිනැති ලිපියෙන් පළාත් පාලන කොමසාරිස් වෙත දැනුම් දී ඇත.

නැවතත් පළාත් පාලන ආයතන වෙතින් මෙතෙක් නොපියවා ඇති ණය ශේෂ එකවර පියවන ලෙස පළාත් භාණ්ඩාගාරයට පිටපතක් සහිතව පළාත් පාලන කොමසාරිස් දැනුවත් කරන ලෙස අභ්‍යන්තර විගණක හා අධ්‍යක්ෂ(ගිණුම් හා ගෙවීම්) උපදෙස් දෙන ලදි.

ආර්.ඒ.එම්.එම්.රණසිංහ මියගෙන් අයවීමට ඇති ණය ශේෂ සම්බන්ධයෙන් නැවත නීති අංශය දැනුවත් කරන ලෙස . නි.ප්‍ර.ලේ.(ඉංජිනේරු) විසින් පරිපාලන නිලධාරිට උපදෙස් ලබා දෙන ලදි.

03 කල් ඉකුත්වූ තැන්පතු

| | ආයතනයේ නම | | තැන්පත් දිනය | තැන්පත්කරුගේ නම | වටිනාකම රු. | විස්තරය |
|---|---|---|---|---|---|---|
| | ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලය - හෝමාගම | 1 | 2022.09.08 | නියදගලග්‍රාම සංවර්ධන සමිතිය GREEN HOUSE - MEEGODA | 86,087.43 | ව්‍යාපෘතියෙ අඩුපාඩු පවතින බවට කොන්ත්‍රාත්කරු දැනුවත් කරන ලද අතර එම අඩුපාඩු සති 02 ක් ඇතුලත නිරවුල් කරන බවට කොන්ත්‍රාත් කරු විසින් දැනුම් දි ඇත. ඒ අනුව එම අඩුපාඩු නිවැරදි කළ පසු නිරවුල් කිරිමට කටයුතු කරනු ලැබෙ. |
| | | 1 | 2022.09.23 | RENOVATIO N OF LAB AT BH HOMA AMA | 97,994.33 | |
| | | 1 | 2022.10.31 | RENOVATIO N OF LAB AT BH HOMAGAMA | 117,535.40 | |
| | මුළු එකතුව | 3 | | | 301,617.16 | |

හෝමාගම ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලයේ වසර දෙක ඉක්ම වු ඉහත සඳහන් තැන්පතු තුන 2024.12.31 දින නිරවුල් කල බව දන්වා ඇත.

ප්‍රධාන කාර්යාලයේ හා අනෙකුත් ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලවල වසර දෙක ඉක්ම වු තැන්පතු නොමැත.

නි.ප්‍ර.ලේකම් (ඉංජිනේරු)

ප්‍රධාන ගණකාධිකාරි / ගණකාධිකාරි /

ප්‍රාදේශීය ඉංජිනේරු

| | | | |
|---|---|---|---|
| 04 | මීගමුව ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලය (නව සහ පැරණි පිහිටි භූමිය බස්නාහිර. පළාත් සභාවට පවරා ගැනීම | මේ වන විට මීගමුව ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලය (නව සහ පැරණි) පිහිටි භූමියට අදාල පිඹුර සකස්කර අවසන් බවත් එහෙත් තව ලේඛන පරීක්ෂාවක් සිදු වෙමින් පවතින බව මිනින්දෝ දෙපාර්තුවෙන් විමසුවිට දැනගත් බවත්, පිඹුරු ලද විට මෙම භූමිය පළාත් සභාවට පවරා දීමට කටයුතු කරන බව ප්‍රාදේශීය ලේකම් පැවසූ බවත් මීගමුව ප්‍රාදේශීය ඉංජිනේරු පැහැදිලි කරන ලදි. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) / පරිපාලන නිලධාරි/ මීගමුව ප්‍රාදේශීය ඉංජිනේරු |
| | මීගමුව ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලයේ ගොඩනැගිල්ල භූමිය වෙනත් ආයතනයකට ලබාදීම. | • පර්චස් 24.2 න් යුතු මෙම භූමියේ ඇති ගොඩනැගිල්ල වර්ග අඩි 2590 න් සමන්විත වන බවත්, මෙම ගොඩනැගිල්ල භාවිතයෙන් තොරව තිබීම සහ මුහුද අද්දර පැවතීම හේතුවෙන් දිනෙන් දින අභාවයට යමින් පවතින බවත්, මෙම ගොඩනැගිල්ල සඳහා මාසිකව ගෙවිය යුතු කුලී මුදල කොපමණද යන්න සම්බන්ධයෙන් තක්සේරුවක් ලබාදිය හැකිනම්, බාහිර පාර්ශවයක් වෙත කුලී පදනම මත ලබා දීමට ඇති හැකියාව පිළිබඳ සොයා බැලීමට හැකි බව මීගමුව ප්‍රාදේශීය ඉංජිනේරු ප්‍රකාශ කරන ලදි.<br>• මෙම පැරණි ගොඩනැගිල්ල පළාත් සංචාරක මණ්ඩලය සභාපති විසින් එම ආයතනයට ලබාගැනීමට විමසූ බව මීගමුව ප්‍රාදේශීය ඉංජිනේරු ප්‍රකාශ කරන ලදි.<br><br>• මෙම ගොඩනැගිල්ලේ වෙනත් ආයතනයකට ලබා දිම සඳහා මෙම ගොඩනැගිල්ලේ දැනට තක්සේරු වටිනාකම ලබා ගැනීමට තක්සේරු දෙපාර්තමේන්තුවට ඉල්ලීමක් යොමු කරන ලෙසත්, මෙම ගොඩනැගිල්ල සංචාරක මණ්ඩලයට ලබාදීමට හැකියාව ඇති බවත් ඒ සඳහා ඉල්ලීමක් ඉදිරිපත් කරන ලෙස සාමාන්‍යාධිකාරි වෙත දැන්වීමට කටයුතු කරන ලෙස නි.ප්‍ර.ලේ.(ඉංජිනේරු) විසින් මීගමුව ප්‍රාදේශීය ඉංජිනේරුට උපදෙස් දෙන ලදි. | |
| | අවිස්සාවේල්ල ගොඩනැගිල්ල | 2024.07.31 දිනට මෙම ගොඩනැගිල්ල භාරනොදුන් බැවින් ඒ සම්බන්ධයෙන් බස්නාහිර පළාත් ප්‍රධාන ලේකම්ගේ ප්‍රධානත්වයෙන් රැස්වීමක් කැඳවීමට තීරණය කරන ලදි. නමුත් විවිධ හේතු මත එම රැස්වීමෙහි දිනය වරින් වර වෙනස් කරන ලද අතර 2024.12.17 දින අවසන් වරට රැස්වීම කැඳවන ලදි.<br>• නමුත් ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශයේ විගණන හා කළමණාකරණ කමිටු රැස්වීම හා ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ ප්‍රගති සමාලෝචන රැස්වීම එදිනට පැවැත්වෙන බැවින් 2024.12.17 දිනට කැඳවන ලද රැස්වීම වෙනත් දිනයකට යොදාගන්නා මෙන් ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ ප්‍රධාන විධායක නිලධාරි ගේ අංක SLTB/HO/02/05/L 01/439 සහ 202412.16 දිනැති ලිපිය මඟින් ඉල්ලීමක් ඉදිරිපත් කරන ලදි. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) / පරිපාලන නිලධාරි/ හෝමාගම ප්‍රාදේශීය ඉංජිනේරු |

| | | | |
|---|---|---|---|
| | | • ඒ අනුව, අදාල රැස්වීම අවලංගු කරන ලද අතර, රැස්වීමට පැවැත්වීම සඳහා පහසු දින 03 ක් වේලාවන්ද සමඟ නම්කර එවන මෙන් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) ගේ අංක CSWP/ENG-ADM/41-4/FI/1 සහ 2024.12.16 දිනැති ලිපිය මඟින් ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයේ ප්‍රධාන විධායක නිලධාරි වෙත දැනුම් දෙන ලද අතර මේ දක්වාත් ප්‍රතිචාරයක් ලැබී නොමැත.<br><br>ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයෙන් මේ වන විටත් රැස්වීම් පැවැත්වීමට දිනයන් දන්වා නොමැති බැවින් ප්‍රධාන ලේකම්ගෙන් දිනයක් ලබාගෙන රැස්වීමක් කැඳවීමට කටයුතු කරන ලෙස නි.ප්‍ර.ලේ.(ඉංජිනේරු) විසින් පරිපාලන නිලධාරිට උපදෙස් ලබා දෙන ලදි.<br><br>• නිල නිවාස සෞඛ්‍ය අමාත්‍යාංශයට පැවරීමට අදාල මැණුම් කටයුතු සම්බන්ධයෙන් මිනින්දෝරු දෙපාර්තමේන්තුව වෙතින් කිහිපවරක් දුරකථනය මඟින් විමසීම් කරන ලද බවත්, සීතාවක ප්‍රාදේශීය ලේකම් විසින් එම ආයතනය වෙත යොමු කරන ලද මැනුම් ඉල්ලීමෙහි යම් කිසි අපැහැදිලිතාවක් ඇති බැවින් එය නිරවුල් කර ගැනීමට සීතාවක ප්‍රාදේශීය ලේකම් වෙත මිනිනදෝරු දෙපාර්තමේන්තුව විසින් ලිපියක් යොමු කරන ලද බවත්, මෙතෙක් ඒ සඳහා පිළිතුරක් ලැබී නොමැති බවත් හෝමාගම ප්‍රාදේශීය ඉංජිනේරු විසින් දන්වා ඇත.<br>• එසේ නමුත් මේ වන විටත් අදාල ඉඩම් කොටස් 02 ක මැනීම් කටයුතු සිදුකර ඇති බවත් අදාල මැනුම් ඉල්ලීම ලද වහාම ඒ සඳහා අවශ්‍ය පිඹුර නිකුත් කිරීමේ හැකියාව පවතින බවත් මිනින්දෝරු දෙපාර්තමේන්තුව විසින් හෝමාගම ප්‍රාදේශීය ඉංජිනේරු වෙත දැනුම් දී ඇති බවත් හෝමාගම ප්‍රාදේශීය ඉංජිනේරුගේ අංක CSO/ENG/5/04/CMSO/2025 සහ 2025.01.29 දිනැති ලිපියෙන් දැනුම් දී ඇත.<br>සිතාවක ප්‍රාදේශීය ලේකම්ගෙන් නැවත විමසීම් කරන ලෙස නි.ප්‍ර.ලේ.(ඉංජිනේරු) විසින් හෝමාගම ප්‍රාදේශීය ඉංජිනේරුට උපදෙස් ලබා දෙන ලදි. | |
| | ඉංජිනේරු කාර්යාංශයට අයත් නිල නිවාස සෞඛ්‍ය අමාත්‍යාංශය වෙත පවරා දීම | | |
| 05 | ලිපිගොනු කළමනාකරණ ක්‍රියාවලිය සම්බන්ධ මෘදුකාංග පද්ධතිය (DMS) | මේ වනවිට ඉංජිනේරු කාර්යාංශයේ සියළුම අංශයන්හි ලිපිගොනු කළමනාකරණ ක්‍රියාවලිය සම්බන්ධ මෘදුකාංග පද්ධතිය (DMS) භාවිතා කරමින් ලැබෙන ලිපි සහ යවන ලිපි Scan කර ගබඩා කිරීම සිදු කරනු ලබන අතර, Process Automation ක්‍රියාවලියේ තවදුරටත් පවතින අඩුපාඩු සම්බන්ධයෙන් තොරතුරු සම්පත් අධිකාරිය වෙත දන්වා ඇත.<br><br>මීට අමතරව ඉංජිනේරු කාර්යාංශයේ සේවය කරන සියළුම නිලධාරීන්ගේ නිවාඩු අයදුම් කිරීමේ කටයුතු 2024.10.01 වන දින සිට මෘදුකාංග පද්ධතිය හරහා සිදු කරන ලෙස නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු)ගේ අංක CSWP/ENG-CON/5-6/FI/1(A) හා 2024.09.27 දිනැති ලිපිය මඟින් උපදෙස් ලබා දී ඇති අතර, එම මෘදුකාංගය භාවිතයේදී මතුව ඇති ගැටළු සම්බන්ධයෙන් ඉංජිනේරු කාර්යාංශයේ එක් එක් අංශ මඟින් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) වෙත ඉදිරිපත් කරන ලද කරුණු CSWP/ENG-CON/5-7/FI/1(A) හා 2024.12.02 දිනැති ලිපිය මඟින් තොරතුරු තාක්ෂණ සම්පත් අධිකාරිය වෙත දන්වා ඇති බව වැඩිදුරටත් කාරුණිකව දන්වමි. | නි.ප්‍ර.ලේ. ඉංජිනේරු/ අධ්‍යක්ෂ ඉංජිනේරු ගොඩනැගිලි අධ්‍යක්ෂ |

| | | | |
|---|---|---|---|
| | | මෘදුකාංගය භාවිතයේදී මතුව ඇති ගැටළු සම්බන්ධයෙන් තොරතුරු තාක්ෂණ සම්පත් අධිකාරිනේ ලැබෙන පිළිතුර අනුව ඉදිරි කටයුතු සිදු කිරිමට තිරණය විය. | |

## 2 ) විගණන අධිකාරිගේ අදහස් හා පැහැදිලි කිරීම්

| | මතුකළ කරුණු |
|---|---|
| 1 | වර්ෂ අවසානයේ 2024.12.31 ට ආසන්නයේ ආරම්භ කරන ලද ව්‍යාපෘති මේ වන විට අවසන් කර ඇත් ද යන්නත්, මේ වන විටත් අවසන් වි නොමැති ව්‍යාපෘති කඩිනමින් අවසන් කරන ලෙස දැනුවත් කරන ලදි. |

## (3) අධ්‍යක්ෂ අභ්‍යන්තර විගණනකගේ අදහස් හා පැහැදිලි කිරම්

| | මතුකළ කරුණු |
|---|---|
| 1 | බැංකු සැසඳුම් ඉදිරිපත් කිරිමේ ප්‍රගතිය අනෙකුත් ආයතන හා සලකා බැලිමේදි ඉතා හොඳ තත්ත්වයක පවතින බවත් |
| 2. | අළුත්වැඩියා කටයුතු වලදි අයින්කරනු ලබන සමහර අයිතම නාස්තිවි යාමට නොදි වැඩදායි හොඳ විකල්ප ක්‍රියා මාර්ග ගැනිම සුදුසු බවත් |
| 3. | අභ්‍යන්තර පාලන ක්‍රම විදි සකස් කරගෙන ඉදිරියට කරගෙන යන ලෙසත් ඒ සඳහා තම දායකතත්වය ලබදෙන බවත් |

## අධ්‍යක්ෂ - ගිණුම් හා ගෙවීම්ගේ අදහස් හා පැහැදිලි කිරිම්

| | මතුකළ කරුණු |
|---|---|
| 1. | PSDG ව්‍යාපෘති සඳහා 2025 වර්ෂයට මහා භාණ්ඩාගාරයෙන් තවම මුදල් ලැබි නොමැති බවත් අයවැයෙන් පසු මුදල් ලැබීමට බොහෝවිට ඉඩ ඇති බව. |
| 2. | රේඛීය අමාත්‍යාංශයන්ට අදාලව පළාත් සභාවෙන් බාරගෙන කරනු ලබන ඉදිරිකිරිම් හෝ නඩතතු වර්ෂය අවසනායේ ලබා ගැනීමෙන් ඊට අදාල ගෙවීම් සිදු කිරිමට යාමේදි 2024 වර්ෂයේදි ගැටළු සහගත තත්ත්වයක් උද්ගතවූ බැවින්, මහා භාණ්ඩාගාරය සමඟ පැවති සාකච්ඡාවකදි 2025 වර්ෂයේ සිට රේඛීය අමාත්‍යාංශයෙන් පළාත් සභාවට ලබාදෙනු ලබන ව්‍යාපෘති ජුනි මාසයෙන් පසු බාර නොගන්නා ලෙසත් කරුණු පැහැදිලි කරන ලදි. |
| 3. | පළාත්මූල්‍ය රීති 429 යටතේ පළාත් සභාවෙන් බැහැර ආයතන වෙනුවෙන් භාරගනු ලබන ඉදිකිරිම් සම්බන්ධයෙන් ඉදිරියෙදි කටයුතු කරන ලෙසත්,<br><br>මු.රීති 429.4 (ඇ) පරිදි පළාත් සභාවෙ කිසියම් ආයතනයක් පළාත් සභා විෂය පථයෙන් බැහැරව ඇත්තාවූ රාජ්‍ය හෝ පෞද්ගලික අංශයේ යම් ආයතනයකට හෝ පුද්ගලයකුට යම් වැඩක්, සේවාවක් හෝ සැපයුමක් ඉටු කරනු ලබන කල්හි, කාර්ය පවරා ඇත්තේ රජයේ හෝ රජයට අනුබද්ධිත සංස්ථාවක් හෝ මණ්ඩලයක් විසින් නම් 20% ක අත්තිකාරම් මුදලක් ලබාගත යුතු අතර, එම අත්තිකාරම් මුදල් ලබාලත් පසු වැඩ ආරම්භ කල යුත බවත් යන්න කෙරෙහි වැඩි අවධානයක් යොමු කරන ලෙසත්, |
| 4. | නව ප්‍රසම්පාදන මාර්ග සංග්‍රහය බස්නාහිර පළාතට අදාලකර ගැනිමට අනුමැතිය ලබා දි ඇති බවත් ඒ අනුව ඉදිරි කටයුතු කරගෙන යන ලෙස |

මේ වන විට ඉංජිනේරු කාර්යාංශයට ලැබෙන විගණන විමසුම් සංඛ්‍යාව අවම වී ඇති බවත්, මෙම කාර්යාංශයේ ප්‍රාදේශීය ඉංජිනේරු කර්යාලවල සේවයේ නියුතු කාර්ය මණ්ඩලයේ කැපවීම නිසා මෙම විගණන විමසුම් අඩුකර ගැනිමට හැකිව ඇති බවත්, විගණනයේ මඟපෙන්වීම ඉදිරි ගමනට පිටුවහලක් වී ඇති බවත් ඒ ගැන අගය කරන බවත් , මාගේ අවසන් විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම මෙය බවත් 2025 වර්ෂයේ කාර්යාල කටයුතු හොඳින් කරගෙන යන ලෙසට ප්‍රාදේශීය ඉංජිනේරුවරුන් දැනුවත් කරන ලදි.

2025 වර්ෂයේ පළමු විගණන කළමනාකරණ කමිටු රැස්වීම බවත්, ඔබගේ වටිනා කාලය වැයකර මෙම රැස්වීම සඳහා සහභාගි විම සම්බන්ධයෙන් රජයේ විගණන අධිකාරි, අධ්‍යක්ෂ - අභ්‍යන්තර විගණක, භාණ්ඩාගාර නියෝජිත - අධ්‍යක්ෂ(ගිණුම් හා ගෙවීම්) , Zoom තාක්ෂණය ඔස්සේ සම්බන්ධ වූ සියළුම ප්‍රාදේශීය ඉංජිනේරුවරුන්ට හා අනෙකුත් සහභාගි වූ සියළු නිලධාරින්ට නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) ස්තුතියපල කිරිමෙන් අනතුරුව රැස්වීමේ කටයුතු පෙ.ව.11.45 ට පමණ අවසන් කරන ලදි.

ඉංජි.කේ.ආර්.අබේසිරිවර්ධන
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු),
පළාත් ඉංජිනේරු කාර්යාංශය,
බස්නාහිර පළාත.

දුරකථන අංකය : 0112092524
ෆැක්ස් අංකය : 0112092523
විද්‍යුත් ලිපිනය : eng.org.acc@gmail.com